# කැලණිය විශ්වවිද්‍යාලය

## සමාජීයවිද්‍යා පීඨය

## භූගෝලවිද්‍යා අංශය මගින් මෙහෙයවන ආපදා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - 2017

උක්ත පාඨමාලාව සඳහා මතු දැක්වෙන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත්‍ර 2017 අප්‍රේල් 30 දක්වා භාරගනු ලැබේ.

**සුදුසුකම් :**

අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් ඕනෑම විෂයයන් තුනකින් සමත් වීම,

හෝ

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව සහ විද්‍යාව යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් සමත් වීම හා ආපදා කළමනාකරණයට අදාල ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර 2 ක පළපුරුද්ද

හෝ

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් විෂයයන් හයකින් සමත් වීම හා ආපදා කළමනාකරණයට අදාල ක්ෂේත්‍රයක අවම වශයෙන් වසර 4 ක පළපුරුද්ද

හෝ

කැලණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි වෙනත් අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් ලබා තිබීම.

සියළුම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, ඉන් සමත් වන අය පමණක් පාඨමාලාවට බඳවාගනු ඇත.

විශේෂයෙන් ම මෙම පාඨමාලාව රාජ්‍ය අංශයේ හා රාජ්‍ය නොවන සංවිධානයන්හි ආපදා කළමනාකරණය පිළිබඳ ක්ෂේත්‍රයන්හි සේවයේ නියුතු නිලධාරීන් සඳහා සැලසුම් කර ඇත.

**පාඨමාලා කාලය :**

එක් අධ්‍යයන වර්ෂයකි. දේශන සහ ප්‍රායෝගික පන්ති සති අන්තයේදී පැවැත්වේ.

**මාධ්‍යය :** සිංහල

**පාඨමාලා ගාස්තු :** රු. 50,000.00 (සියළු ගාස්තු ඇතුලත්ව, වාරික දෙකකින් ගෙවිය හැකිය)

**අයදුම්පත් :**

කැලණිය මහජන බැංකු ශාඛාවේ 055-100130667553 දරණ කැලණිය විශ්වවිද්‍යාලයීය ගිණුමට බැර වන සේ කැලණිය මහජන බැංකු ශාඛාවට රු. 500.00 ක අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා ලබාගත් බැංකු රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් පාඨමාලා අයදුම්පත්‍රය සහ විස්තර පත්‍රිකාව ලබාගත හැකිය.

http://ss.kln.ac.lk/depts/geography/ යන භූගෝලවිද්‍යා අධ්‍යයන අංශයේ වෙබ් පිටුවෙන් ද අයදුම්පත්‍රය ලබාගත හැකිය. එසේ ලබාගත් අයදුම්පත්‍රය සම්පූර්ණ කර අදාල බැංකු රිසිට්පත සමඟ අධ්‍යයන අංශය වෙත සතියේ දිනවල පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා පැමිණ භාර දීම හෝ තැපැලෙන් එවිය හැකිය.

අයදුම්පත් තැපැලෙන් ඉල්ලුම් කරන්නේ නම්, ඉල්ලුම් කරන කවරයේ වම්පස ඉහළ ආපදා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතු අතර, අදාල බැංකු රිසිට්පත සමඟ ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය ලියූ රු. 15.00 ක් වටිනා මුද්දර ඇලවූ “9 X 4 ” ප්‍රමාණයේ ලියුම් කවරයක් පහත දැක්වෙන ලිපිනයට යොමු කිරීමෙන් ලබාගත හැකිය.

**අයදුම්පත් 2017.04.01 දින සිට නිකුත් කරනු ලැබේ.**


විස්තර සඳහා : සම්බන්ධීකාරක
ආපදා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
දුරකතන : 0718026162/ 0112914489/ 0112903920/ 0112903927

අයදුම්පත් එවිය යුතු ලිපිනය : අංශ ප්‍රධාන
භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය

ලේඛකාධිකාරී
කැලණිය විශ්වවිද්‍යාලය
2017.03.26


මෙම දැන්වීම සෙ.මී. 12 X 20 ප්‍රමාණයේ හෝ ඊට කුඩා විය යුතුය.